## 2024-05-13 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. ප්‍රතිඵල පාදක කළමනාකරණය රාජ්‍ය අංශය තුළ ආයතනගත කිරීම

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රේඛීය අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධව, ඉහළ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කෙරෙන අමාත්‍යාංශ 10ක සහ ඒ යටතේ පවතින ආයතනවල "අමාත්‍යාංශයීය ප්‍රතිඵල රාමු" සකස් කර තිබේ. සෑම අමාත්‍යාංශයකම ධුරාවලි වගකීම් සමඟ අනුගත වෙමින්, අදාළ ආයතනයන්හි විෂය පථයන් තුළ සංවර්ධන ඉලක්කයන් කාලීනව සාක්ෂාත් කර ගැනීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර ගැනීම එකී අමාත්‍යාංශයීය ප්‍රතිඵල රාමු මගින් සහතික කරනු ඇත. එසේම, ජනතා අවශ්‍යතාවන් කඩිනමින් ඉටු කිරීම පිණිස සිදු කරනු ලබන ආයෝජනයන්හි ඵලදායිතාව මිනුම් කළ හැකි ප්‍රතිඵල සඳහා යොමු වූ ආයතන ව්‍යූහයක් මෙමගින් ඇති වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ඒ අනුව, පිළියෙල කරනු ලැබ ඇති අමාත්‍යාංශයීය ප්‍රතිඵල රාමුවල අන්තර්ගත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ වගකීම අදාළ රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත පැවරීමටත්, එම කටයුතුවල කාර්යසාධනය අධීක්ෂණය කිරීම ජාතික මෙහෙයුම් මැදිරිය වෙත පැවරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සේවකයින් සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම

2019 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිත සමාගමක් බවට පත් වූ ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් හා වගකීම් පවරා ගැනීමටත් එහි සේවකයින් අන්තර්ග්‍රහණය කර ගැනීමටත් මේ වන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් තීරණය කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සේවකයින් ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර, එහිදී විකල්පයක් වශයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමටත්, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගනු ලබන සේවකයින් සඳහා වෙළෙඳපොළ සාධක සැලකිල්ලට ගනිමින් ගෙවීමක් කිරීමටත් තීරණය කර තිබේ. එකී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තෙ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) වෘත්තීය පුහුණුව ලබා දීමේදී උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ට ප්‍රමුඛතාව ලබා දීම**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්/අසමත් බව නොසලකා උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව හැදෑරීම සඳහා සිසුන්ට අවස්ථාව සලසා දී ඇති අතර, මේ වන විට සෑම අධ්‍යාපන කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි පාසල් 604ක එම විෂය ධාරාව ක්‍රියාත්මක වේ. එම විෂය ධාරාව යටතේ 12 වන ශ්‍රේණියේදී මෘදු කුසලතා සංවර්ධනය කරන පොදු විෂයයන් හැදෑරිය යුතු අතර, 13 වන ශ්‍රේණියේදී ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) පාඨමාලාවක් මාස 06ක කාලයක් හැදෑරීමට සහ මාස 06ක රැකියාගත පුහුණුවක යෙදීමට සිසුන්ට අවස්ථාව සලසා දෙනු ලැබේ. එම සිසුන් සඳහා NVQ 4 මට්ටමේ පාඨමාලා පවත්වාගෙන යාම සඳහා අමාත්‍යාංශ 07ක් යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන 17ක් මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇත. දැනට වෘත්තීය විෂය ධාරාව හැදෑරීම සඳහා සිසුන් 50,000ක් පමණ ලියාපදිංචි වී ඇති බැවින් අදාළ වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක වන සියලුම වෘත්තීය පුහුණු ආයතන විසින් එකී සිසුන් සඳහා ප්‍රමුඛතාව ලබා දීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, සියලුම අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන විසින් උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව හදාරනු ලබන සිසුන්ට වෘත්තීය පුහුණුව ලබා දීම අනිවාර්ය කාර්යයක් බවට පත් කිරීමටත්, එම ආයතනවල NVQ 4 පාඨමාලාවලට වාර්ෂිකව සිසුන් ඇතුළත් කර ගැනීමේදී වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ට ප්‍රමුඛත්වය ලබා දී පුහුණුවට අවශ්‍ය පහසුකම් සැලසීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය නිම වූ වහාම අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වීමෙන් පසු එහි ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුවට අවම වශයෙන් මාස 03කට ආසන්න කාලයක් ගත වේ. මෙම කාලය තුළ සිසුන් පාසල් අධ්‍යාපනයෙන් බැහැර වීම, ඔවුන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හැදෑරීම සඳහා යොමු වීමේ ප්‍රවණතාව අඩු වීමට මෙන් ම එමඟින්

විවිධ සමාජ ගැටලු නිර්මාණය වීමට ද හේතු වී ඇත. එම කරුණු සැලකිල්ලට ගෙන, සිසුන්ගේ කාලය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ අ.පො.ස. (උසස් පෙළ) විෂය නිර්දේශය ආවරණය සඳහා ගුරුවරුන්ට ප්‍රමාණවත් කාලයක් සලසා දීමට හැකි වන පරිදි, 2024 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වීමත් සමඟ පාසල් තුළ උසස් පෙළ අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම යෝග්‍ය බව හඳුනාගෙන තිබේ. ඒ අනුව, 2023 වර්ෂයට අදාළව 2024 මැයි මස අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටින සිසුන් සඳහා එම විභාගය අවසන් වූ වහාම අ.පො.ස (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. විදුලි පාරිභෝගිකයින් සඳහා චක්‍රීය ජව පහසුකම (Power Wheeling Facility) ක්‍රියාත්මක කිරීම**

විදුලිබල අවශ්‍යතාව පවතින ස්ථානයක් වෙත විදුලිය සැපයීම සඳහා විදුලි සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පද්ධතිවලින් සමන්විත විදුලිබල පද්ධතිය සාමූහිකව භාවිත කිරීමට මග සලසන ප්‍රවේශය, චක්‍රීය ජව පහසුකම (Power Wheeling Facility) ලෙස හඳුන්වනු ලබයි. ගාස්තුවක් ගෙවීමට යටත්ව දැනට පවතින විදුලිබල පද්ධතිය භාවිත කරමින් තමන් සතුව වෙනත් ස්ථානයක පවතින විදුලිබල සැපයුමක්, බලශක්ති පිරිවැය ඵලදායී ලෙස අවම කර ගනිමින් ප්‍රයෝජනයට ගැනීමට චක්‍රීය ජව පහසුකම යටතේ විදුලි පාරිභෝගිකයින්ට ඉඩ සැලසේ. එකී ක්‍රමවේදය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට දැනට නීතිමය ප්‍රතිපාදන නොමැති බැවින් එම පහසුකම ලබා දීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක අධ්‍යයනයක් කිරීම පිණිස කමිටුවක් පත් කරනු ලැබ ඇත. එම කමිටුවේ නිර්දේශ මත පදනම්ව නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පමණක් චක්‍රීය ජව පහසුකම ක්‍රියාත්මක කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් නිලධාරීන් 1,000ක් ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරීලත් තනතුරුවලට පත් කිරීම**

1985 අංක 40 දරන මිනිස්බල උපයෝගිතා හා පරිපූරක හමුදා පනතේ V වන කොටස යටතේ පරිපූරක හමුදාමය ආයතනයක් වශයෙන් ජාතික ශිෂ්‍යභට බලකාය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇත. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිළිවෙලින් එම

බලකායේ නිලධාරීන් හා ශිෂ්‍යභටයින් ලෙස බඳවාගනු ලැබේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යභට කටයුතු තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා අධිකාරීලත් නිලධාරීන් ලෙස ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවය යන සේවාවලට අයත් නිලධාරීන් ජාතික ශිෂ්‍යභට බලකායට බඳවාගැනීම පිණිස මූලික පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට අදහස් කර ඇති අතර, එකී සේවාවන්වල I, II සහ III ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 1,000ක් බඳවා ගෙන මූලික පුහුණු පාඨමාලාවකින් පසු අධිකාරීලත් නිලධාරීන් ලෙස පත් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවය යන සේවාවන්ට අයත් සුදුසුකම්ලත් නිලධාරීන් 1,000ක් විධිමත් ලෙස තෝරාගෙන කාණ්ඩ 03ක් යටතේ පුහුණු කර අධිකාරීලත් නිලධාරී තනතුරට පත් කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 07. තාක්ෂණ ප්‍රවර්ධන පනත් කෙටුම්පත

ඩිජිටල් සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා සහ 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම පිණිස 2023-12-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඩිජිටල් සංවර්ධනය සඳහා නව නීති හඳුන්වා දීම පිණිස සංකල්ප පත්‍රිකාවක් සකස් කර ඇති අතර, එමඟින් තාක්ෂණික නවෝත්පාදන කවුන්සිලයක් සහ ඩිජිටල් සංවර්ධන නියෝජිතායතනයක් පිහිටුවීමට යෝජනා කර තිබේ. 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත අවලංගු කරමින් තාක්ෂණ ප්‍රවර්ධන පනත හඳුන්වා දීමටත්, පිළියෙල කරනු ලැබ ඇති සංකල්ප පත්‍රිකාව මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 08. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් කඩිනම් කිරීම

කඩිනමින් සංවර්ධනය විය යුතු යැයි හඳුනාගත් ක්ෂේත්‍ර සඳහා 2024 අයවැය මඟින් යෝජනා 50ක් යටතේ රුපියල් බිලියන 212.59ක ප්‍රතිපාදන අමාත්‍යාංශ කිහිපයක් වෙත වෙන් කරනු ලැබ ඇත. එම

යෝජනා අතුරින් 13කට අදාළ ව්‍යාපෘති ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. පසුගිය වසර කිහිපය තුළ පැවති ආර්ථික ගැටලු හේතුවෙන් සහ විදේශ ආධාර මත ආරම්භ කරනු ලැබ ඇති ඇතැම් සංවර්ධන වැඩසටහන් ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන අවසන් වන තෙක් අත්හිටුවීමට සිදුව ඇති බැවින්, ග්‍රාමීය මට්ටමින් සිදු කිරීමට සැලසුම් කර තිබූ සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාවට අහිමි වී ඇත. විශේෂයෙන්ම, ග්‍රාමීය මාර්ග, පාලම්, කුඩා වැව්, ඇළ මාර්ග වැඩිදියුණු කිරීම, ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් මෙන්ම ග්‍රාමීය පාසල්, රෝහල්, අඩු ආදායම් නිවාස සහ ග්‍රාමීය ජලසම්පාදන වැනි සංවර්ධන ව්‍යාපෘති කඩිනමින් අවසන් කර දෙන ලෙස විවිධ පාර්ශ්ව වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. ඊට පිළියමක් වශයෙන් ජනාධිපති කාර්යාලය යටතේ ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇති වැඩසටහන්වලින් අපේක්ෂිත ඉතුරුම් අරමුදල්, ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන අත්‍යවශ්‍ය සංවර්ධන කාර්යයන් හා අතරමග නවතා දමා ඇති ග්‍රාමීය සංවර්ධන කාර්යයන් නිම කිරීම සඳහා යොදා ගැනීම පිණිස පාර්ලිමේන්තුව වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **රණවිරුවන්ගේ පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීමේ ව්‍යාපෘතිය**

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී දිවි පිදූ, අතුරුදහන් වූ හා රණක්ෂිතයට පත් වූ, විශ්‍රාමික සහ දැනට සක්‍රිය සේවයේ යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ, ශ්‍රී ලංකා පොලිසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන්ට පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබා දීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වරින් වර චක්‍රලේඛ උපදෙස් නිකුත් කරනු ලැබ ඇත. දැනට අනුමතව පවතින ක්‍රමවේදය තුළ රණවිරුවන්ට හිමි වන සහනය ප්‍රමාණවත් නොවන බවත්, භුක්ති විඳින ඉඩම් සඳහා හිමි වන කොන්දේසි සහිත නීත්‍යානුකූල ලේඛනවල පවතින සීමාකාරී සාධක හේතුවෙන් එම ඉඩම්වල සැබෑ ආර්ථිකමය වටිනාකම නිරූපණය නොවන බවත් නිරීක්ෂණය වී තිබේ. එබැවින්, රණවිරුවන්ට ඉඩම් ලබා දීමේදී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය හේතුවෙන් පැන නැගී ඇති ගැටලු සඳහා විසඳුම් ඇතුළත් කරමින් පවත්නා ක්‍රමවේදය සංශෝධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 10. ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත

2024-03-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතෙහි මූලික කෙටුම්පත සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දී ඇති අතර, නීතිපති විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධනයන් ද ඇතුළත් කරමින් විධිමත් පනත් කෙටුම්පත කඩිනමින් සකස් කර ඉදිරිපත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

***************